ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1639/22 - 2010 පෙබරවාරි 03 වැනි බදාදා - 2010.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 22/71 (ii).

### 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත

30 සහ 31 වැනි වගන්ති යටතේ නියමය

ක 46 දරන පොල් සංවර්ධන පනතේ 30 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය මගින් සහ එකී පනතේ 31 වැනි වගන්තියේ (4) ගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වැවිලි කර්මාන්ත අමාත්‍ය දි.මු. ජයරත්න වන මම මෙම නියමය මගින් 1979 ර මස 31 වැනි දින අංක 69/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු

1. එහි පළමුවන උපලේඛනයේ 8 වැනි අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කර්තව්‍ය එකතු කිරීමෙන් –

"(9) ඉඩම්වල පොල් වගා කිරීම සහ පොල් වගා කිරීමට සහාය වීම, එය වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීම;

(10) පොල් වගාවන් තුළ පොල් සහ වෙනත් වැවිලි වගා කිරීම සම්බන්ධයෙන් සුදුසු වගා කිරීමේ ව්‍යවහාරයන් පිරිවිතර කිරීම, ජනප්‍රිය කරවීම, වැඩිදියුණු කිරීම සහ මෙහෙයවීම.".

2. එහි දෙවන උපලේඛනයෙහි 6 වැනි අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන බලතල එකතු කිරීමෙන් –

"(7) ඉඩම්වල පොල් වගා කිරීමෙහි, පොල් වගාවන් තුළ වූ ඉඩම් වගා කිරීමෙහි සහ ප්‍රයෝජනයට ගැනීමෙහි නියුක්ත වීම, ඒවා විධිමත් කිරීම, පාලනය කිරීම, අධීක්ෂණය කිරීම, මෙහෙයවීම, කළමනාකරණය කිරීම සහ පරීක්ෂා කිරීම.".

දි. මු. ජයරත්න,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

බරවාරි මස 03 දින,

මාන්ත අමාත්‍යංශයේ දී ය.